සියලු ම හිමිකම් ඇවිරිණි.

පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සඳහා
ඉලක්ක ප්‍රශ්න පත්‍ර කට්ටලය
කලාප අධ්‍යාපන කාර්යාලය - තඹුත්තේගම

5 ශ්‍රේණිය

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES

පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

I පත්‍රය

පැය 1යි

විභාග අංකය :- .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන් වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.


පිටු අංකය	ලැබූ ලකුණ
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	


	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු වන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි.	V/I/S
දෙවන වන පරීක්ෂක පළමු වන පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/I/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	V/I/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/I/S/CH

(2 වැනි පිටුව බලන්න)


◆ **01 හා 02 ප්‍රශ්න සඳහා පහත රූපවලට වඩාත් ගැළපෙන රූප කොටස තෝරා යටින් ඉරක් අඳින්න.**

01.






1.




2.



3.

02.





1.



2.




3.

◆ **අංක 03 හා 04 ප්‍රශ්න සඳහා මුලින් ඇති අදහසට වඩාත් ගැළපෙන රූපය තෝරන්න.**


03. ප්‍රවාහන මාධ්‍යයකි , ඉන්ධන අවශ්‍ය නැත , ව්‍යායාමයක් ලැබේ.



1.



2.



3.

04. සුරතලය , ආරක්ෂාව , පොලිස් රාජකාරි



1.



2.



3.

05. අන්තර් සම්බන්ධතාවයක් දැකිය හැකි වචන ඇතුළත් කොටුව තෝරන්න.


ඇඳ සකපෝරුව වඩු කර්මාන්තය	වළඳ සකපෝරුව කුඹල් කර්මාන්තය	වළඳ කිණිහිරය කුඹල් කර්මාන්තය
1.	2.	3.


06. ඇපල් ගෙඩියක මිල රු. 35.00 කි. දොඩම් ගෙඩියක මිල රු. 45.00 කි. වෙළඳපොළට ගිය නාත්තා මේ දෙවර්ගයෙන් ම ගෙඩි එක සමානව මිලදී ගත්තේ ය. ඔහුට ඒ සඳහා වැය වූ මුදල රු. 320.00 ක් නම්, නාත්තා මිලදී ගත් දොඩම් ගෙඩි ප්‍රමාණය කීය ද?

1. 4 2. 3 3. 2


(3 වැනි පිටුව බලන්න)

07. මුලින් දී ඇති රටාවට අනුව ඊළඟට එන රටාව වන්නේ,






1.



2.



3.

◆ **පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පද වලට පිළිවෙළින් ගැළපෙන පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.**

08. ඇයගේ **චත** ඉතාමත් **පියකරු ය.**

1. මුහුණ , බියකරු
2. වරලස , ලස්සන
3. මුහුණ ,ප්‍රිය උපදවන සුළු

09. සියා **කෝපිකාලේ වැඩ** කිරීමට **දක්ෂයෙකි.**

1. පැරණි කාලේ වැඩ , සමතෙකි.
2. පැරණි කාලේ වැඩ , බුද්ධිමතෙකි.
3. කෝපි පානය කරමින් , සමතෙකි.

10. කොටුව තුළ ඇති සංඛ්‍යා දෙක වෙනුවට යෙදිය හැකි සංඛ්‍යා සහිත කොටුව තෝරන්න.

$\boxed{65 \div 5} \times 6 = 78$

1. $\boxed{7 + 7}$
2. $\boxed{8 + 5}$
3. $\boxed{9 \times 3}$

11. 2020 මැයි 01 ඉරිදා දවසකි. එම මාසයට දින 5 බැගින් ඇති සති ගණන කීය ද?

1. 1
2. 2
3. 3


12. ඔරලෝසුවක පැය කටුවත් මිනිත්තු කටුවත් සෘජුකෝණයක් සහිතව පිහිටන වේලාව මින් කුමක් ද?

1. 6.00
2. 3.00
3. 3.30

13. මා සංඛ්‍යාවක් සිතුවෙමි. එම සංඛ්‍යාව 5 න් බෙදා 8 ක් අඩු කළ විට පිළිතුර 35 විය. මා සිතූ සංඛ්‍යාව කීය ද?

1. 28
2. 42
3. 215

14.



මෙම කොටුවල දැක්වෙන රූපවලට කිසියම් අගයක් ආදේශනය කර ඇත. ඒ අනුව ? යන ස්ථානයට ගැළපෙන රූපය තෝරන්න.

1. 
2. 
3. 


15. නෙත්මිගේ හා සිත්මිගේ වයස්වල එකතුව අවුරුදු 60 කි. නෙත්මිගේ වයස සිත්මිගේ වයස මෙන් සිව් ගුණයකි. නෙත්මිගේ වයස කීය ද?

1. අවුරුදු 12 2. අවුරුදු 48 3. අවුරුදු 15

16. 200m දිවීමේ තරගයකට අමිඳු , දුමිඳු හා චමිඳු සහභාගී විය. එහිදී අමිඳු තත්පර 23 කදී ද, දුමිඳු තත්පර 26 කදී ද, චමිඳු තත්පර 20 කදී ද තරගය නිම කළෝය. ඔවුන් තිදෙනාගෙන් ජයග්‍රහණය කලේ කවුරුන් ද?

1. චමිඳු 2. අමිඳු 3. දුමිඳු

17. පහත ගැටලුවට නිවැරදි පිළිතුර තෝරන්න.



1. 80
2. 65
3. 67

18. බසයක ගමන් ගත් යහළුවන් තිදෙනෙක් ගමන් වියදම ගන්නා ලෙස කොන්දොස්තර මහතාට රු. 100 ක මුදලක් දුන්නෝ ය. එවිට කොන්දොස්තර මහතා තවත් රු. 5ක් ඉල්ලාගෙන යහළුවන්ට ඉතිරිය ලෙස රු. 30 ක මුදලක් දුන්නේ ය. ඒ අනුව එක් යහළුවෙක්ගේ මගී ගාස්තුව කීය ද?

1. රු. 75.00 2. රු. 25.00 3. රු. 30.00

19. වෛද්‍ය මධ්‍යස්ථානයක් සතියේ සෙනසුරාදා හා ඉරිදා හැර සතියේ සෑම දිනක ම ප්‍රතිකාර සඳහා විවෘත කර තබයි. උදේ 8.00 සිට මධ්‍යහ්න 12.00 දක්වාත් සවස 3.00 සිට රාත්‍රී 8.00 දක්වාත් ප්‍රතිකාර කරයි නම්, සතියක් තුළ විවෘතව තබන පැය ගණන කීය ද?


1. පැය 50 2. පැය 40 3. පැය 45

20. පළමු ඉලක්කම 5327 ඇත. 3573 නැත. දෙවන ඉලක්කම 7152 ඇත. 5124 නැත. තුන්වන ඉලක්කම 2691 නැත. 9128 ඇත. හතරවන ඉලක්කම 460 ඇත. 641 නැත. ඒ අනුව නිවැරදි සංඛ්‍යාව වන්නේ,

1. 3581 2. 2780 3. 2181

(5 වැනි පිටුව බලන්න)

◆ **පහත ප්‍රස්තාරයෙන් දැක්වෙන්නේ සති 5ක් තුළ පොත් අලෙවි සැලක අලෙවි වූ පුවත්පත් ප්‍රමාණය පිළිබඳ තොරතුරකි. ඒ අනුව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




21. ඒ අනුව 6 වන සතියේ අලෙවි විය හැකි පුවත්පත් සංඛ්‍යාව කීයක් විය හැකි ද?

1. 400 2. 500 3. 600

22. තුන්වන හා හයවන සතියේ අලෙවි විය හැකි පුවත්පත්වල වෙනස කීය ද?


1. 400 2. 300 3. 200

23. පහත ඇති රූපය ලබා ගැනීමට කඩදාසි තීරුව නවා ඇති ආකාරය දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.



1.


2.


3.


24. පහත දැක්වෙන රූප මුහුණ බලන කණ්ණාඩියක් ඉදිරියෙන් අල්ලා බැලූ විට ඇඳ ඇති ආකාරයට ම පෙනෙන රූප ඇතුළත් පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.




1. 

2. 


3. 


(6 වැනි පිටුව බලන්න)

25. 


මෙම ඝන වස්තුව පෙන්වා ඇති තිත් ඉර දිගේ කැපූ විට එක් කොටසක මුහුණත් ගණන හා පෘෂ්ඨ ගණන පිළිවෙළින් දැක්වෙන්නේ කුමන පිළිතුරේ ද?

1. 3 , 1 2. 2 , 1 3. 4 , 2


26. කිසියම් රටාවක් ගොඩනැගීම සඳහා  එක් වරක් ද,  දෙවරක් ද,  තුන් වරක් ද,  සිව් වරක්ද යොදා ගනිමින් ගොඩනගා ඇති රූපය තෝරන්න.



1.



2.



3.

27. අමිත් සුමිත්ට පෙර ක්‍රීඩා පිටියට පැමිණි අතර සුමිත්ට පසුව ක්‍රීඩා පිටියෙන් ඉවත් විය. සුගත් සුමිත්ට පසුව ක්‍රීඩා පිටියට පැමිණි අතර ජගත්ට පෙර ක්‍රීඩා පිටියෙන් ඉවත් විය. වැඩිම කාලයක් ක්‍රීඩා පිටියේ සිටින්නේ කවු ද?

1. අමිත් 2. සුගත් 3. ජගත්

28. ගසක නිතර ම ඇත්තේ,

1. මුල් 2. මල් 3. කොළ

29. වැකියක නිතර ම ඇත්තේ,

1. නැවතීමේ තිත 2. වචනය 3. අර්ථය

30. බෝනික්කන් තිදෙනෙක් මිනිත්තු 3කට, මිනිත්තු 5කට, මිනිත්තු 7කට වරක් පිළිවෙළින් නාද කරති. මේ තිදෙනාම පෙ.ව. 8.30ට එකවර නාද කළේ නම් නැවත බෝනික්කන් තිදෙනාම එකවර නාද කරන්නේ කීයට ද?


1. පෙ.ව. 10.15 2. පෙ.ව. 9.45 3. පෙ.ව. 10.30

31. ජාත්‍යන්තර ක්‍රීඩා උත්සවයක් පැවැත්වෙන්නේ අවුරුදු 4කට වතාවකි. 2020 දී එම උත්සවය පැවැත්වුයේ 30 වන වතාවට ය. 10 වන වතාවට එම උත්සවය පැවැත්වූ වර්ෂය කුමක් ද?

1. 1970 2. 1940 3. 1948


(7 වැනි පිටුව බලන්න)

32. මෙම රෝදයේ වටේ දිග 180cm කි. රෝදය 18m ගමන් කරන විට කැරකෙන වට ගණන කීය ද?




1. 18
2. 36
3. 10

◆ **පහත රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.**



33. රවුම තුළ ඇති සංඛ්‍යා වලින් දෙකෙන් ඉතිරි නැතිව බෙදෙන ඉලක්කම් ගණන කීය ද?

1. 5
2. 6
3. 7

34. 


මෙහි ඇති ත්‍රිකෝණ ගණන කීය ද?

1. 5
2. 6
3. 7

35. එක්තරා විලක සෑම දිනකම පෙර දින තිබූ නෙලුම් මල් ප්‍රමාණය දෙගුණ වී පිපෙයි. පළමුදා උදේ නෙලුම් මල් ප්‍රමාණය 3ක් පිපී තිබුණි. මෙම විලේ නෙලුම් මල් 96 පිපෙන්නේ කීවෙනි දිනයේ ද?

1. 6 වන දිනයේ
2. 5 වන දිනයේ
3. 7 වන දිනයේ

36. මෙම රූපයට අනුව ලියා ඇති සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.



1. මෙහි ත්‍රිකෝණ ගණන වෘත්ත ගණනට සමාන වේ.
2. මෙහි සෘජුකෝණාස්‍ර ගණන අනෙක් සියලු ම හැඩතල වල එකතුවට වඩා වැඩි ය.
3. මෙහි සමචතුරස්‍ර ගණන තුනකි.

(8 වැනි පිටුව බලන්න)

◆ **පහත රූප පරීක්ෂා කර පිළිතුරු තෝරන්න.**


A


B


C


D


E


F


G


H

37. මෙහි ශාක කොටස් උපයෝගී කරගෙන නිර්මාණය කර ඇති උපකරණ වන්නේ

1. BCA 2. AGH 3. HAE

38. මෙහි මැටි යොදා නිර්මාණය කරන ලද උපකරණ කාණ්ඩය වන්නේ,

1. CEF 2. CDF 3. DEF

39. □ + △ = 12 නම්, □ - △ = 6

□ + △ + △ = ... අගය කීයද?

1. 12 2. 14 3. 15

40. කාඩ්පතේ සඳහන් කර ඇති සංඛ්‍යාව කියද?

දහස් ස්ථානය 8 , සියස්ථානය 6 , එකස්ථානය 5 දහය ස්ථානය 3 , දසදහස් ස්ථානය 2

1. 28635 2. 826 35 3. 28653

සියලු ම හිමිකම් ඇවිරිණි.

පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සඳහා
ඉලක්ක ප්‍රශ්න පත්‍ර කට්ටලය
කලාප අධ්‍යාපන කාර්යාලය - තඹුත්තේගම

5 ශ්‍රේණිය

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES

පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

පැය 1යි මිනිත්තු 15 යි

විභාග අංකය :- .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන් වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දීඇති ප්‍රශ්නවලට තිත් ඉරි මත පිළිතුරු ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණ
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු වන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි.	V/II/S
දෙවන වන පරීක්ෂක පළමු වන පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/II/S/CH

(2 වැනි පිටුව බලන්න)

01. පහත ඡේදය හොඳින් කියවන්න.

එක් අතකින් මුහුදටත්, අනෙක් අතින් විශාල නදියකටත් මැදි වූ අපේ ගම් පෙදෙස කුඩා බිම් තීරයකි. පොල් ගසින් ද, දෙල් ගසින් ද සෙවණ වූ, අත්තන, කිඩාරම්, බලු නගුට, කහඹිලියා, බුරුල්ල, කිරිල්ල, ගඳපාන යන ආදියෙන් හෙවුණු කැලෑ රොදවල් බහුල බිම් පෙදෙස් හැර, අප සිත් ගත් සුදු වැලි තලා ඇති වන රොදක් ද එහි විය. කජු, මාදන්, අඹ යන ආදි ගස්වලට වැඩි විශාල වෘක්ෂයන් නොවුවද, නොයෙක් වර්ගයේ පක්ෂීන් ද හාවුන් ද, ලෙහෙනුන් ද, සර්පයන් ද,මුගටියන් ද, උගුඩුවන් ද, වල් මීයන් ද වාසය කරන ඝනව වැඩුණු ඇපල පඳුරු, එරමිණියා සහ ගඳපාන අකුල, බෝවිටියා ගොමු එහි බහුල විය. පේර ගස්වල බෙහෙවින් පේර හටගත් නමුදු ඉදුණු පේර ගෙඩියක් අපට කඩා ගන්නට ලැබුණේ ඉතා ම කලාතුරකිනි. පේරයක් යන්තම් පැසී කහ පාට වී ගෙන එනු දකින ළමයින් එය කඩා ගන්නා බැවිනි.

◆ **ඡේදය ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

i. ඉහත ඡේදයෙන් කියවෙන්නේ කුමක් ගැන ද?

.....

ii. මෙහි සිත් ගත් තැනක් වන්නේ කුමක් ද?

.....

iii. මෙහි වාසය කරන සතුන් කවුරුන් ද?

.....

iv. ඡේදයේ සඳහන් අනුක්ත පදයක් ලියන්න.

.....

v. 'නොවැඩුණු' යන පදයේ විරුද්ධ පදය ලියන්න.

.....

vi. එක් අතකින් මුහුදටත්, අනෙක් අතින් විශාල නදියකටත් මැදි වී තිබෙන්නේ කුමක් ද?

.....

(ලකුණු 01 × 6 = 06)

02. ප්‍රාණවාචී අතීතකාල බහු වචන ක්‍රියාපදය තෝරා යටින් ඉරක් අඳින්න.

i. ගියේ ය. ii. දිළිසුණේ ය. iii. පැමිණියෝ ය.

(ලකුණු 02 × 1 = 02)

03. නිවැරදිව වචන ගළපා වාක්‍ය සකස් කරන්න.

සේවය / හොඳින් / මම / කරමි / ඉගෙන / රටට

.....

(ලකුණු 02 × 1 = 02)

(3 වැනි පිටුව බලන්න)

II පත්‍රය

විභාග අංකය :- .....

04. පහත සඳහන් එක් එක් වගන්තිවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් ''✓'' ලකුණ ද, වැරදි නම් ''×'' ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

i. කිකිළිය කෑම සොයා ගියේ ය. (.....)

ii. නිවේදකයා විස්තර කථනයක් ඉදිරිපත් කළේ ය. (.....)

iii. ලේඛකයා රචනා පොතක් රචනා කළා ය. (.....)

iv. ගුරුවරයා පාඩම් කියා දුන්නේ ය. (.....)

(ලකුණු 01 × 4 = 04)

05. ගැළපෙන විරාම ලකුණු යොදන්න.

ගුරුතුමනි මේ ලෝකය බෙහෙත්වලින් ම මවා ඇති සේ ය ඖෂධ කළයක් වැනි ය

(ලකුණු 02 × 1 = 02)

06. i. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කිරීමට සුදුසු වචන හිස්තැනෙහි ලියන්න.

පරංගියා ..... ගියා වගේ

ii. පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉර මත ලියන්න.

සැම විට ම තමන් සමඟ තවත් අයෙක් එකට සිටීම

.....

(ලකුණු 02 × 1 = 02)

07. පහත සඳහන් එක් එක් වාක්‍යයෙහි නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

i. ගවයා (ආර්තික / ආර්ථික) වාසි ලබා දෙන සතෙකි.

ii. (නවුකාව / නෞකාව) වරායට ළඟා වෙයි.

(ලකුණු 02 × 1 = 02)

08. පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

i. කිරිල්ලිය ඉහළ අහසේ පියාසර කරයි.

.....

(ලකුණු 02 × 1 = 02)

09. i. ස්ත්‍රී ලිංග පදය ලියන්න. සිංහයා - .....

ii. විරුද්ධ පදය ලියන්න. පුරුදු - .....

(ලකුණු 02 × 1 = 02)

10. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

i. Peacock - ..... ii. Duster - .....

(ලකුණු 02 × 1 = 02)

11. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරින් ම ලියන්න.

i.  - ..... ii.  - .....

(ලකුණු 02 × 1 = 02)

12. දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

i. This / car / is / small / a .....

ii. is / That / tree / a mango .....

(ලකුණු 02 × 1 = 02)

(4 වැනි පිටුව බලන්න)

13. ''පත්තෝන්බදු'' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

.....

(ලකුණු 01 × 1 = 01)

14. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

i. මගේ පැන්සල කහ පාට යි.

.....

(ලකුණු 01 × 1 = 01)

◆ **දී ඇති හිස්තැන මත පිළිතුරු සපයන්න.**

15. එකක මිල රු. 26.50 බැගින් වූ පොත් 9ක් මිල දී ගත් නිමල් රු. 500 නෝට්ටුවක් මුදලාලිට දුන් පසු ඔහුට ලැබුණු ඉතිරි මුදල කොපමණ ද?


.....

16. 87623 සංඛ්‍යාවෙහි 6 ඉලක්කම පිහිටා ඇති ස්ථානය කුමක් ද?

.....


17. 25300 යන සංඛ්‍යාවේ 5 ඉලක්කමෙහි ස්ථානීය අගය ලියන්න.

.....

18. 

ගණක රාමුවෙහි නිරූපණය වන සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

.....


19. 

මෙවැනි පැන්සල් දෙකක දිග කීය ද?

.....

20. දිග $7m$ වූ කම්බියකින් $25cm$ කැබලි 5ක් කපාගත් පසු ඉතිරි කැබැල්ලේ දිග කීය ද?

.....

21. 

i. මෙම පතරොම භාවිතා කර සෑදිය හැකි ඝන වස්තුව කුමක් ද?

.....

ii. එහි දාර ගණන කීය ද?

.....

22. එක් පපඩම් පැකට්ටුවක පපඩම් 28ක් ඇත. එවැනි පැකට් 7ක ඇති පපඩම් ගණන කීය ද?

.....

23. 

i. රූපයේ අඳුරු කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

.....

ii. රූපයේ අඳුරු කර නොමැති කොටස භාගයක් ලෙස ලියන්න.

.....

(5 වැනි පිටුව බලන්න)

24. A භාජනයේ ජලය $4l\ 755ml$ ඇත. B භාජනයේ ජලය $2l\ 800ml$ ඇත. භාජන දෙකේ ඇති ජල පරිමාණ අතර වෙනස කීය ද?

.....

25. එක්තරා සංඛ්‍යාවක හතර ගුණයට 40ක් එකතු කළ විට පිළිතුර 280 වේ. එම සංඛ්‍යාව කුමක් ද?

.....

26. වට්ටියක ඇති නෙලුම් මල් ගණන 412 කි. එය සමාන ගොඩවල් හතරකට වෙන්කලේ නම් එක ගොඩක ඇති නෙලුම් මල් ගණන කීය ද?

.....

27. කුඹුරක ගොයම් කැපීම පෙ.ව. 7.45 ට ආරම්භ වී ප.ව. 4.15 ට අවසන් විය. ගොයම් කැපීමට ගත වූ කාලය සොයන්න.

පැය ..... මිනිත්තු .....

28. රුවන් 800m පයින් ද, 8km 75m ක දුරක් පා පැදියෙන් ද, 3km 200m දුරක් බසයෙන් ද ගමන් කළේ ය.

i. ඔහු පයින් හා බසයෙන් ගමන් කළ මුළු දුර කොපමණ ද? .....

ii. ඔහු ගමන් කළ මුළු දුර කොපමණ ද? .....

29. මිල දර්ශනය උපයෝගී කරගෙන පහත බිල්පත පුරවන්න.

හාල් 1kg - රු. 100.00
පරිප්පු 500g - රු. 75.00
පාන් පිටි 1kg - රු. 90.00
තේ කුඩු 100g - රු. 110.00

භාණ්ඩය	ප්‍රමාණය	මිල රු.	සත.
හාල්	1kg 500g	i.	.....
පරිප්පු	250g	ii.	.....
පාන් පිටි	2kg	180	00
තේ කුඩු	250g	iii.	.....
	එකතුව	iv.	.....

(15 සිට 29 දක්වා ලකුණු $02 \times 15 = 30$)

◆ **අංක 30 සිට 59 තෙක් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

30. අපට ප්‍රිය උපදවන යහපත් පුරුද්දකි

1. අපිරිසිදු ඇඳුම් ඇඳීම.
2. කොණ්ඩය කපා පිළිවෙළකට පීරීම.
3. නියපොතු වවා තිබීම.

31. සූර්ය නමස්කාර ක්‍රියාකාරකමේ අවසාන ඉරියව්ව වන්නේ,



1.



2.



3.

(6 වැනි පිටුව බලන්න)

32. වැඩුනු මිනිසෙකුගේ මුඛයේ ඇති දත් වර්ග ගණන වන්නේ,
1. 5කි. 2. 4කි. 3. 6කි.

33. රූපවාහිනියසොයා ගත් පුද්ගලයා වන්නේ,
1. තෝමස් අල්වා එඩිසන්
2. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්
3. ජෝන් ලොගී බෙයාර්ඩ්

34. ආහාර වමාරා කන ක්ෂීරපායි සිවුපා සතෙකි
1. එළුවා 2. ගවයා 3. බල්ලා

35. කාලගුණික වෙනස්වීම් හඟවන සතෙක් වන්නේ,
1. බල්ලා 2. ලේනා 3. මෙරුවා

36. කොග්ගල ප්‍රාඥයා යන නමින් හඳුන්වන්නේ,
1. පිලිප් ගුණවර්ධන මහතා
2. ආතර් වී දියෙස් මහතා
3. මාර්ටින් වික්‍රමසිංහ මහතා

37. 
මෙම රූපයෙන් දැක්වෙන්නේ,
1. ලංකාතිලක විහාරය
2. දඹුලු විහාරය
3. කැලණි විහාරය

38. කඳේ මල් හට ගන්නා ශාකයක් වන්නේ,
1. ඇහැළ 2. රඹුටන් 3. නමිනං

39. 
නිල් පාට පසුබිමක දැක්වෙන මෙම සංඥාවෙන් ප්‍රකාශ වන්නේ,
1. බස්රථ නැවතුමකි.
2. වාහන නවත්වන ස්ථානයකි.
3. පදික වේදිකාවකි.

40. ශ්‍රී ලංකාවට දැඩි ලෙස බලපාන ස්වභාවික ආපදාවක් වන්නේ,
1. සුනාමි 2. භූමිකම්පා 3. ගංවතුර

41. කාල නියමයක් නොමැති ව මල් පිපෙනා ශාක දෙවර්ගයකි
1. කොහොඹ , තේක්ක 2. පොල් , කෙසෙල් 3. පුවක් , රබර්

42. 'කරඳමුංගු' යනුවෙන් හැඳින්වෙන්නේ මොනවා ද?
1. එනසාල් 2. කරඹු නැටි 3. සාදික්කා

(7 වැනි පිටුව බලන්න)

43. මිලාද් උත්සවය යනු,
    1. ජේසුතුමාගේ උපත සැමරීමේ උත්සවය යි.
    2. ශිව දෙවියන් හා බැඳුනු උත්සවය යි.
    3. නබි නායකතුමාගේ උපන් දිනය සැමරීමේ උත්සවය යි.

44. මෙම ඇටවුම වන්නේ,
    1. දිය හොල්මන
    2. ජලය චක්‍රය
    3. ජල පෙරනයකි



45. තනි පෙත්තක මලක් සහිත ජලාශ්‍රිත ශාකයකි
    1. වැටකෙයියා 2. ගහල 3. කොහිල

46. 

    මෙම රූපයෙන් දැක්වෙන වීර චරිතය වන්නේ,
    1. අනගාරික ධර්මපාලතුමා
    2. වීර පුරන් අප්පු
    3. ගොන්ගාලේ ගොඩබණ්ඩා

47. 'චිකුන්ගුන්යා' රෝගය පතුරුවන රෝග වාහකයා වන්නේ,
    1. මදුරුවෙකි. 2. මීයෙකි. 3. මැස්සෙකි.

48. එකම පළාතකින් මුහුදට ගලා බසින ගංගා ඇතුළත් පිළිතුර කුමක් ද?
    1. මහවැලි , කැලණි 2. කැලණි , නිල්වලා 3. කැලණි , කළු

49. රාත්‍රී කාලයේ පමණක් පිපෙන බොහෝ මල්,
    1. කහ පාට ය. 2. දම් පාට ය. 3. සුදු පාට ය.

50. විෂබීජ නාශක ගුණය සහිත ඖෂධයකි
    1. ඉඟුරු 2. රණවරා 3. කහ


51. පහත දැක්වෙන සේවා අතුරින් රජය මඟින් නොමිලේ සැපයෙන සේවාවක් වන්නේ මින් කුමක් ද?
    1. සෞඛ්‍යය 2. සන්නිවේදනය 3. ප්‍රවාහනය

52. 'කෑමට කෑදරකම් නොකරන්නේ' කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,
    1. සිරිත් මල්දම 2. ලෝවැඩ සඟරාව 3. සුභාෂිතය

53. අපිරිසිදු ජලය පානය කිරීම නිසා සෑදෙන රෝග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. සෙංගමාලය . හෙපටයිටිස් , දියවැඩියාව
    2. ජලහීතිකාව , අපස්මාරය , පාචනය
    3. අතීසාරය , පාචනය , කොළරාව

(8 වැනි පිටුව බලන්න)

54. රූපයේ දැක්වෙන්නේ,



1. ලියවැල් මෝස්තරයක්
2. පලාපෙති මෝස්තරයක්
3. ගල් බින්දුව

55. බරක් ඉහළට එසවීම වඩාත් පහසු කිරීමට යොදා ගනියි

1. වියළි කෝෂ 2. විද්‍යුත් චුම්භකය 3. කප්පිය

56. කැප්ටන් ඩෝසන් කුලුණ අයත් පළාත වන්නේ,

1. උඩ පළාත 2. මධ්‍යම පළාත 3. වයඹ පළාත

57. අපේ රටේ ප්‍රධාන ගුවන් තොටුපළ පිහිටා ඇත්තේ කුමන පළාතේ ද?

1. බස්නාහිර 2. උතුර 3. නැගෙනහිර

58. මුහුදු වෙරළට මායිම් නොවන පළාතක් වන්නේ,

1. බස්නාහිර පළාත 2. උතුරු මැද පළාත 3. වයඹ පළාත

59. දෘෂ්‍යාබාධිතයින්ට හඳුනා ගැනීම සඳහා සහ වෘත්තාකාර සංකේත 3ක් යොදා ඇති නව මුදල් නෝට්ටුව වන්නේ,

1. රුපියල් 500.00 2. රුපියල් 100.00 3. රුපියල් 5000.00

(30 සිට 59 දක්වා ලකුණු 01 × 30 = 30)

60. '' මගේ සුරතල් සතා'' යන්න මාතෘකාව කරගනිමින් වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)

i. .....
.....

ii. .....
.....

iii. .....
.....

(ලකුණු 02 × 3 = 06)

(පැහැදිලි අත් අකුරු වලට අමතර ලකුණු 2ක් හිමි වේ.)